**රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය- 2013**

**-----------------------------------------------------------**

රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගම් ආඥාපනතේ (283 අධිකාරය) සහ 1983 අංක 18 දරණ රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගම් පනතේ 18 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විස්තරාත්මක විගණකාධිපති වාර්තාව සංගමයේ සභාපතිවරයා වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූපව ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල

කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංගමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

වත්කම් භාවිතා කිරීම සඳහා සුදුසු තත්ත්වයට පත්වූ දින සිට අපහරණ කරන දින දක්වා ක්ෂය ගණනය කළ යුතු වුවත්, සංගමය විසින් මිලදී ගත් වත්කම් අපහරණය කරන ලද වර්ෂයේ අදාල කාලපරිච්ඡේදය සඳහා ක්ෂය කිරීම් සිදු කර නොතිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මියගිය හා සාමාජිකත්වය අහිමි වූ සාමාජිකයන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ශේෂය රු.2,028,593 ක් විය. මෙම මුදලින් රු.1,784,822 ක් වසර 01 සිට වසර 05 කාල පරාසයක සිට හිඟව තිබූ අතර, සාමාජිකයන් 71 කුගෙන් අයවිය යුතු රු.1,489,217 ක් සම්බන්ධයෙන් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේ අයවී නොතිබුණි. මෙයට අතිරේකව ණයපොලී හා උපචිත මුදල් පැහැර හැර ඇති සාමාජිකයන් 20 කුගෙන් අයවිය යුතු රු.849,023 ක මුදලක්ද දීර්ඝ කාලයක සිට පරිශේෂව පැවතුණි. මේ අනුව, මෙම ණය අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතියද ඒ සම්බන්ධව ප්‍රමාණවත් වෙන් කිරීමක් සිදු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රදානමික මුදල් ගෙවීම පැහැර හැරීම නිසා අයවිය යුතු රු.16,735 ක්, ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2012 මාර්තු 22 දින මියගොස් තිබුණු සාමාජිකයකුගෙන් සංගමයට අයවිය යුතුව තිබුණු රු.44,334 ක් සඳහා 2012 අප්‍රේල් මාසයේදී ණය වාරික වශයෙන් රු.4,194 ක් ලැබී තිබුණද, සාමාජිකයාගෙන් අයවිය යුතු ණය මුදලෙන් එම ණය වාරික අඩුකිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ ඇතුළත් කර තිබුණි. මේ නිසා අයවිය යුතු ණය මුදල රු.4,194 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) අනුරාධපුර නිවාඩු නිකේතනය සැලැසුම් කිරීම සඳහා උපදේශක සමාගමකට ගෙවිය යුතුව තිබුණු රු.425,139 ක් වූ මුදල ගිණුම්ගත කර නොතිබුණි.

## 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

ණයගැතියන් ලෙස පරිගණක වාර්තාවේ දක්වා තිබුණු සාමාජිකයින් හත් දෙනෙකුගේ ආරම්භක ශේෂයන් සහ ණයගැති උපලේඛනයේ දැක්වෙන එම ශේෂ අතර එකතුව රු.37,979 ක වෙනසක් පැවතුණි.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සෑම සාමාජිකයකු විසින්ම මරණ ප්‍රදාන අරමුදලට සෑම මාසයක් සඳහා ම රු. 25 බැගින් හෝ වයස අවුරුදු 50 සම්පූර්ණ වීමෙන් පසු රු.5 බැගින් වූ ප්‍රදානමික වාරික ගෙවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන දිනට මාස 03 සිට අවුරුදු 01 දක්වා කාල පරාසයකට අයත් සාමාජිකයින් 3 කුගෙන් රු.1,155 ක්ද, සාමාජිකත්වය අහිමි වීමේ ලිපි යවන ලද සාමාජිකයින් 8 කුගෙන් රු.15,580 ක් වූ ප්‍රදානමික දායක මුදල් ද අය නොවී පැවතිණි.

(ආ) මාස 03 සිට අවුරුදු 01 දක්වා කාල පරිච්ඡේදයකට අයත් සාමාජිකයින් 38 දෙනෙකුගෙන් එකතුව රු.152,271 ක් වූ දායක මුදල් සමාලෝචිත වර්ෂය අවසාන දිනට අය නොවී පැවතුණි.

(ඇ) රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර සාධක සංගම් ව්‍යවස්ථාවේ (සංශෝධිත) රීති අංක 14 යටතේ ඉකුත් වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතුව තිබුණු රු.98,307 ක් වූ ප්‍රදානමික ණය සඳහා පොළිය මරණ ප්‍රදාන ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් අයවී නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට වර්ගීකරණය නොකල ප්‍රේෂණ ගිණුමෙහි රු.1,029,761ක්ද, විවිධ ගැලපීම් ගිණුමෙහි සාමාජික ණය වෙනුවෙන් වූ රු.574,672 ක්ද නිරවුල් නොවී පැවතුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් වී නොතිබුණි.

| විෂය | ගිණුම් අනුව ශේෂය | ඉදිරිපත් නොකල සාක්ෂි |
| --- | --- | --- |
| | රු. | |
| වර්ග නොකල ප්‍රේෂණ | 931,664 | ශේෂ සනාථ කිරීමේ ලිපි, කේවල ශේෂ ලයිස්තු |
| සාමාජිකත්වය අහෝසි වූවන්ගේ දායක මුදල් | 14,087,460 | |

| | | |
|---|---|---|
| ගෙවිය යුතු මරණ ප්‍රදාන | 2,705,000 | ශේෂ සනාථ කිරීමේ ලිපි |
| පොදු තැන්පත් | 98,096 | |
| සේවා සඳහා ලැබුණු අත්තිකාරම් | 67,386 | |
| ගෙවිය යුතු ණය | 75,408 | |
| විවිධ ණයගැතියෝ | 2,073,269 | |
| සාමාජිකයින්ට ණය | 656,120,290 | ණය කාලවිශ්ලේෂණ |
| ආපසු ගෙවිය යුතු තැන්පත් | 65,985 | ශේෂ සනාථ කිරීමේ ලිපි, ගිවිසුම්, තැන්පතුවලට අදාල මුලාශ්‍ර ලියවිලි |
| නීතිඥ ගාස්තු සහ තක්සේරු ගාස්තු | 64,674 | ණය ඉල්ලුම්කරුවන් පිළිබඳ විස්තර, කාල විශ්ලේෂණ |

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තිරණ වලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගමයේ සංශෝධිත ව්‍යවස්ථාව | |
| (i) 10 (අ) (ii) ඇ වගන්තිය | මරණ ප්‍රදාන වෘද්ධි සංචිත අරමුදලේ අතිරික්ත මුදල්, භාණ්ඩාගාරයේ එකඟතාවය මත ආයෝජනය කලයුතු වුවද මෙම අරමුදලට සහ වෙනත් අරමුදල් ගිණුම් යටතේ වූ එකතුව රු.68,415,353 ක් 2013 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතුවල සංශෝධිත ව්‍යවස්ථාව පරිදි භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමකින් තොරව ආයෝජනය කර තිබුණි. |
| (ii) 10 (1) වගන්තිය | සාමාජිකයකුගේ මරණය දැනුම්දී මාස දෙකක් ඇතුලත ඔහුට හිමි මරණ ප්‍රදානය ගෙවිය යුතු වුවත්, එකතුව රු.2,705,000 ක් වූ ගෙවිය යුතුව තිබුණු මරණ ප්‍රදාන මුදලින් රු.1,710,000 ක් 2012 වර්ෂයට පෙර මිය ගිය අයට ගෙවිය යුතු මරණ ප්‍රදාන විය. ඒ අනුව මරණයක් සිදුවී සංගමයට දැනුම්දීමෙන් පසු සංගමය විසින් මරණ ප්‍රදාන ගෙවීමේ විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | |
|---|---|
| (iii) ව්‍යවස්ථාවේ II පරිච්ඡේදයේ 11 වන වගන්තිය | දේපල ණය සඳහා උකස් කල දේපලවල පවතින තත්වයත් එහි වටිනාකමත් සම්බන්ධයෙන් පාලන කමිටුව විසින් වර්ෂ 2 කට වරක් සියළුම උකස් කර නැවත සලකා බැලිය යුතු වූ අතර උකස් කල දේපල තත්වය හා වටිනාකම පිළිබඳව පරීක්ෂා කල යුතු යැයි පාලන කමිටුවට හැඟී ගියහොත් පාලන කමිටු සාමාජිකයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මඟින් පරීක්ෂා කල යුතු විය. එහෙත් උකස් කරන ලද දේපල සලකා බලා පරීක්ෂා කල යුතු දේපල තිබේද යන්න හඳුනාගැනීමක් කර නොතිබුණි. |
| (iv) 1891 අංක 05 දරන රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගම් පනතේ II පරිච්ඡේදයේ 12-V උප වගන්තිය සහ 12-VII උප වගන්තිය | කාර්ය මණ්ඩලයට දේපල ණය ලබාදීමේදී වෘත්තීය තක්සේරුකරුවන් දෙදෙනෙකුගේ තක්සේරු වාර්තා සහ ණය මුදල් ආවරණය සඳහා තාවකාලික සහතිකවීමේ ඔප්පුවක් සහිතව ණය ඇපවීමේ රක්ෂණ ඔප්පුවක් එම ණය මුදල සඳහා ඉල්ලුම්කරන්නා විසින් ඉදිරිපත් කළ යුතු වුවත්, සංගමය විසින් 2013 වර්ෂයේදී කාර්ය මණ්ඩලයට දේපල ණය ගෙවීමේදී ඉහත පරිදි කටයුතු කර නොතිබුණි. |
| (iv) 1891 අංක 5 දරන රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගම් පනතට අනුව 2007 ජනවාරි 05 දිනැති සංශෝධිත ව්‍යවස්ථාවෙහි II පරිච්ඡේදයේ 5 (I) වගන්තිය සහ 5 (II) වගන්තිය | ණයවලින් අයකර ගත යුතු පොලී ප්‍රමාණය වර්ෂයකට සියයට 12 වුවත් පොලිය අයවිය යුතු මාසයට පසු මාසයේ දහවන දින හෝ ඊට පෙර පොලිය නොකඩවා ගෙවනු ලබන කල්හි අයකර ගතයුතු පොලී ප්‍රමාණය සියයට 9 කි. එසේම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරනු ලබන පොලී ප්‍රමාණයට අනුකූලව පොලි ප්‍රමාණය වෙනස් කිරීමට පාලන කමිටුවට හැකියාව තිබූ නමුත් දේපල ඇපයට තබාගෙන සාමාජිකයන්ට මුදල් ණයට දීමට තීරණය කර තිබුණු දිනවල පැවති සියයට 12 ක්වූ පොලි ප්‍රතිශතයම අඛණ්ඩව සාමාජිකයාගෙන් අයකර තිබුණු අතර මහ බැංකු පොලී අනුපාතය පිළිබඳව සමාලෝචනයක් පාලන කමිටුව විසින් සිදුකර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංගමයේ මෙහෙයුම් ප්‍රතිඵලය (බදුවලට පසු) රු.35,738,993 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඉකුත් වර්ෂයේ අනුරූපි (බදුවලට පසු) ශුද්ධ ලාභය රු.28,705,879 ක් වුයෙන් සමාලෝචිත වර්ෂය සඳහා සංගමයේ ලාභයෙහි රු.7,033,114 ක එනම් සියයට 24.05 ක වැඩිවීමක් දැක්විණි. එම වර්ධනයට හේතුව වූයේ ණය පොළී ආදායම වැඩි වීමයි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1. කාර්ය සාධනය**

**(අ) සංගමයේ යහපාලනයට පාලන කමිටුවල දායකත්වය සහ පාලන කමිටු රැස්වීම්වලට සාමාජිකයින්ගේ සහභාගිත්වය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාසික හා විශේෂ පාලන කමිටු 20 ක් පවත්වා තිබුණද, භාණ්ඩාගාරය විසින් පත්කල එක් නියෝජිතයෙක් කමිටු සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වී තිබුණු බැවින් ඔහු සහභාගී විය යුතුව තිබුණු රැස්වීම් 13 කින් රැස්වීම් 07 ක් සඳහා පමණක්ද අනෙක් නියෝජිතයා රැස්වීම් 13 කින් රැස්වීම් 08 ක් සඳහා පමණක්ද සහභාගිවී තිබුණි.

(ii) කමිටුවලට පැමිණීම් විස්තර අනුව මාසික පාලන කමිටු, අතිරේක පාලන කමිටු සහ අනුකමිටුවලට පත්වූ සමහර සාමාජිකයින් එම කමිටුවලට අඩුවෙන් සහභාගි වී තිබුණි. මේ නිසා සංගමයේ අභිවෘද්ධිය සඳහා තීරණ ගැනීමේදී සමහර කමිටු සාමාජිකයින්ගෙන් ප්‍රමාණවත් දායකත්වයක් සංගමයට ලැබී නොතිබුණි.

**(ආ) සාමාජිකත්වය**

රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමයේ සාමාජිකත්වය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ වසර 05 තුල සාමාජිකත්වය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| 01.01 දිනට සාමාජිකත්වය | 10727 | 10664 | 10947 | 10982 | 11091 |
| <u>එකතු කලා</u> | | | | | |
| නව බඳවා ගැනීම් | 363 | 671 | 393 | 358 | 583 |
| නැවත සාමාජිකත්වය ලබාදීම | 48 | 35 | 22 | 13 | 6 |
| <u>අඩු කලා</u> | | | | | |
| සාමාජිකත්වයෙන් ඉවත් වීම් | 474 | 423 | 380 | 262 | 210 |
| 12.31 දිනට සාමාජිකත්වය | 10664 | 10947 | 10982 | 11091 | 11,470 |

පහත සඳහන් නිරික්ෂණයන් කරණු ලැබේ.

2009 දෙසැම්බර් 31 දිනට 10664 ක් වූ සාමාජික සංඛ්‍යාව 2013 දෙසැම්බර් 31 දින වන විට 11470 ක් දක්වා පමණක් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂ පහ තුලදී ඉතා විශාල ප්‍රමාණයක් රාජ්‍ය සේවයට බඳවා ගෙන තිබුණද, සංගමයේ නව සාමාජිකයන් 2368 ක් පමණක් බඳවා ගෙන තිබුණි.
ඒ අනුව සංගමයේ නව සාමාජිකත්වය වර්ධනය කර ගැනීම සහ සාමාජිකයන් රඳවා ගැනීම සඳහා අර්ථාන්විත ක්‍රමවේදයන් සංගමය විසින් අනුගමනය කර නොතිබුණි.

**(ඇ)** <u>**සාංවත්සර රැස්වීම්වලට සාමාජිකයින්ගේ පැමිණීම**</u>

සංවත්සරික රැස්විමේදී සංගමයේ පාලක සභාව සඳහා සාමාජිකයින් තෝරාපත්කර ගනු ලැබූවද එම සංවත්සරික රැස්විම්වලට සාමාජිකයින්ගේ පැමිණීම ඉතා අඩු තත්වයක පැවතුණි. මේ නිසා සංගමයේ පාලක සභාවට සාමාජිකයින් තෝරා ගැනීම සහ සංවත්සර රැස්වීමේදී යෝජනා සඳහා දායකත්වය ලබාදීමේදී වැඩි සාමාජිකයින්ගේ නියෝජන මත සිදුවී නොතිබුණි. එම තත්වය සංගමයේ ඉදිරි කටයුතු සඳහා අහිතකර ලෙස බලපෑමට හැකියාව ඇති බව විගණනයේදී නිරික්ෂණය විය. සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ හයක සංවත්සර රැස්වීමට සාමාජිකයින්ගේ පැමිණීම පහත දැක්වෙන පරිදි අඩුවීමක් සිදුවී තිබුණද එම තත්ත්වයෙන් බැහැරවීමට සංගමය කටයුතු කල බවට සාක්ෂි නොවීය.

| වර්ෂය | සාමාජික සංඛ්‍යාව | සංවත්සර රැස්වීමට පැමිණි සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| 2013 | 11,470 | 1,502 | 13.09 |
| 2012 | 11,091 | 1,377 | 12.42 |
| 2011 | 10,982 | 1,363 | 12.41 |
| 2010 | 10,947 | 1,334 | 12.18 |
| 2009 | 10,664 | 1,185 | 11.11 |
| 2008 | 10,727 | 1,037 | 9.67 |
| 2007 | 10,897 | 976 | 8.96 |

## 4.2 ණය කළමනාකරණයේ පැවති දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නියැදි පරීක්ෂාවකදී දේපල ණය ගෙවා තිබුණු සාමාජිකයින් 8 දෙනෙකුගෙන් වැඩියෙන් මුදල් අයකර තිබීම නිසා එම අයගේ සාමාජික ණය පොත්වල රු.18,003 සෘණ ශේෂ ලෙස දක්වා තිබුණි.

(ආ) අවසන් වරට ගණුදෙනු කල දිනයට අනුව අයවිය යුතුව තිබුණ රු.1,971,583 වැටුප් ණය ශේෂ 64 ක්ද, රු.458,741 ක දායක මුදල් ශේෂ 53 ක්ද, රු.58,873 ක මරණ ප්‍රදාන ණය ශේෂ 6 ක්ද, දිගුකාලයක සිට අක්‍රීය ණය ශේෂ ලෙස පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) සාමාජික අංක 16857 පාස්පොත පරීක්ෂාවේදී දායක ඉතිරි කිරීම් මුදල් නොමැති වුවද, අයවිය යුතු දායක ණය රු.44,885 ක්ද වැටුප් ණය රු.57,633 ක්ද වශයෙන් එකතුව රු.102,518 ක මුදලක් පැවති අතර 2009 සැප්තැම්බර් 14 දිනෙන් පසුව කිසිදු ණය වාරිකයක් ගෙවා නොතිබුණි.

(ඈ) 2013 වර්ෂය තුළදී එකතුව රු.72,785 ක් වූ පරිගණක ණය ලබාදී තිබුණු සාමාජිකයන් දෙදෙනෙකුගෙන් කිසිදු වාරිකයක් හෝ පොලී මුදලක් අයවී නොතිබුණි.

## 4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

සාමාජිකයින්ගේ සුහසාධනය සඳහා නිවාඩු නිකේතනයක් ඉදි කිරීමට 2013 ඔක්තෝබර් 31 දින මුල්ගල තබා තිබුණද, එහි ඉදි කිරීම් කටයුතු 2014 ජූනි 30 දින වන විටද ආරම්භ කර නොතිබුණි.

## 4.4 අවිධිමත් ගනුදෙනු

සංගමයේ ගොඩනැගිල්ලෙහි බිම් මහල කුලියට ලබාදී තිබුණු ආයතනය 2013 මාර්තු මාසයේදී ඉවත්ව ගොස් තිබුණ නමුත්, භාණ්ඩ කොටසක් ඉවත් කරගෙන ගොස් නොමැති වීම නිසා එම ආයතනයෙන් අයවිය යුතු කුලී ලෙස රු.207,000 ක් දක්වා තිබුණි. එම මුදල් අයවීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

## 4.5 ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුර පුරප්පාඩුව පැවතීම

සංගමයේ ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුර සඳහා නිලධාරියෙකු 2011 ජූනි 01 දින සිට 2013 ජූනි 11 දක්වා පත්කර නොතිබුණු අතර සහකාර ලේකම් වශයෙන් බඳවාගෙන තිබුණු නිලධාරිනිය එදින සිට ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුරෙහි වැඩ බැලීමට කටයුතු කර තිබුණි. 2013 ජූනි 12 දින බඳවාගෙන තිබුණු ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික නැවත 2013 දෙසැම්බර් 31 දින සිට ඉවත්ව ගොස් තිබුණි. සංගමයේ ප්‍රධාන පරිපාලන නිලධාරී තනතුර මෙසේ හිස්ව පැවතීම සංගමයේ කළමනාකාරිත්වයේ දුර්වලතාවයන් ලෙස නිරීක්ෂණය වේ.

## 4.6 ආර්ථික නොවූ ගනුදෙනු

සංගමය විසින් රු.10,000 ක තැන්පතුවක් තබා 1995 වර්ෂයේ සිට ලංකා බැංකුවේ සුරක්ෂිතාගාරයක් පවත්වා ගෙන ගොස් තිබුණි. වර්තමානයේ ආයතනයේ සියළු ලිපි ලේඛන සංගමයට අයත් ගොඩනැගිල්ලේ පවත්වා ගෙන ගොස් තිබියදී සමාලෝචිත වර්ෂයේදී ද සුරක්ෂිතාගාරයක් පවත්වා ගැනීම වෙනුවෙන් රු.4000 ක ගාස්තුවක් ගෙවා තිබුණි.

## 4.7 ගොඩනැගිලි අරමුදල

ගොඩනැගිලි අරමුදලේ සමාලෝචිත වර්ෂය අවසානයට රු.10,774,103 ක් පැවතුණද, එයින් රු.1,877,350 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු අතර, රු.6,683,866 ක් වැටුප් ණය ගෙවීම සඳහා යොදාගත් ලෙස සලකා සියයට 7 බැගින් වූ පොලියක් අරමුදලට බැර කර තිබුණි.

ව්‍යවස්ථාවේ 19.1 ආ වගන්තිය අනුව මෙම අරමුදල වැටුප් ණය ගෙවීම සඳහා පමණක් යොදා ගත යුතු බැවින් රු.6,683,866 ක් වූ මුදල වැටුප් ණය ගෙවීම සඳහාම යොදාගෙන තිබුණු බවට තහවුරු කර ගැනීමට සාක්ෂි නොතිබුණි.

## 4.8 පරිගණක පද්ධතියේ දුර්වලතා

සංගමයේ කාර්යන් සඳහා පරිගණක වැඩසටහනක් සකස් කිරීම වෙනුවෙන් 2010 වර්ෂයේදී රු.970,000 ට අදියර 05 කින් සමන්විත කොන්ත්‍රාත්තුව පුද්ගලික සමාගමකට ලබාදී තිබුණි. එහි පළමු අදියර සඳහා ඉකුත් වර්ෂයේදී රු.225,000 ක් ගෙවා තිබුණ අතර අනෙකුත් අදියරයන් ක්‍රියාත්මක කර නොතිබුණි. ක්‍රියාත්මක කර තිබුණු පරිගණක වැඩ සටහනේ පහත සඳහන් කාර්යයන් ඉටුවී නොතිබුණි.

(අ) අවසන් ගිණුම් සකස් කිරීමට හැකි පරිගණක වැඩසටහනක් සකස් කළ යුතු වුවත්, ලබාදී තිබුණු පරිගණක වැඩසටහන මගින් අවසන් ගිණුම් සකස් කිරීමට නොහැකි වී තිබීම.

(ආ) ආදායම් හා වියදම් ගිණුම්වල ආරම්භක ශේෂ පැවතීම.

(ඇ) විවිධ ණයගැතියන් සම්බන්ධව පරිගණක පද්ධතියේ දැක්වෙන තොරතුරුවල අඩුපාඩු පැවතීම.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 සංයුක්ත සැලස්ම

2003 ජුනි 02 දින හා අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 වන වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණි.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

සංගමය විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.3 අභ්‍යන්තර විගණනය

සංගමයේ අභ්‍යන්තර විගණනය සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් යොදවා ඵලදායී විගණනයක් ඉටුකර ගැනීමට සංගමය කටයුතු කර නොතිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

අයවැය ලේඛනය හා තථ්‍ය සංඛ්‍යා අතර විෂයයන් 48 ක සියයට 10 සිට සියයට 138 දක්වා වූ සැලකිය යුතු විචලනයක් පැවති බැවින් අයවැය ලේඛනය සඵල කළමනාකරණ ඒකකයක් ලෙස යොදවා ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර සංගමයේ ඒකාබද්ධ ලේකම් සහ භාණ්ඩාගාරිකගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ) පරිගණක පද්ධතිය
(ආ) මරණ ප්‍රදාන ක්‍රමය
(ඇ) ගොඩනැගිලි අරමුදල
(ඈ) සාමාජිකත්වය වර්ධනය කරගැනීම
(ඉ) අයවැය ලේඛනය
(ඊ) සාමාජික ණය
(උ) ස්ථාවර වත්කම්
(ඌ) පාලන කමිටු ක්‍රියාකාරීත්වය